සැ. යු.- 2008.10.10 දින පළ වූ  අංක 1,571 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,572 - 2008 ඔක්තෝබර් මස 17 වැනි සිකුරාදා - 2008.10.17

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1342 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1344 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 ඔක්තෝබර් මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 ඔක්තෝබර් මස 10 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

1339 - B 079949 —9,100 (2008/10)

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරිම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදි වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිනේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත් හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරිම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩි ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටි. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ ප්‍රතයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනී එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන් පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කළින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකුලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණත් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරීන් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත භටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ පහත සඳහන් තනතුරු සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් 2008.11.10 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ 'පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ තමන් අයදුම් කරන තනතුර සඳහන් කළ යුතු ය.

01. *(අ)* හැන්සාඩ් වාර්තාකරු (සිංහල)
*(ආ)* හැන්සාඩ් වාර්තාකරු (දෙමළ)
*(ඇ)* හැන්සාඩ් වාර්තාකරු (ඉංග්‍රීසි)

1.1 *වැටුප් පරිමාණය :*

වාර්ෂිකව රු. 2,71,020 -3 x 3,900/13 x 4,800-රු.345,120 වේ. (මෙම වැටුප් පරිමාණය මත දීමනා ද සහිතව අවම මාසික වැටුප ආසන්න වශයෙන් රු. 39,700ක් පමණ වේ.)

හැන්සාඩ් වාර්තාකරුවෙකු වශයෙන් වසර 10ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ විට, ජ්‍යෙෂ්ඨ හැන්සාඩ් වාර්තාකරු තනතුරට උසස් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලබන අතර රු. 2,98,440-5 x 7740 /8 x 9,480-රු. 4,12,980 යන වාර්ෂික වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ. (මෙම වැටුප් පරිමාණය මත දීමනා සමග අවම මාසික වැටුප ආසන්න වශයෙන් රු.46,600ක් පමණ වනු ඇත.)

1.2 *වයස :*

2008.11.10 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රජයේ සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නිරත අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

1.3 *අධ්‍යාපන සුදුසුකම් :*

*(අ)* සිංහල හැන්සාඩ් වාර්තාකරුවන් සඳහා සිංහල භාෂාවට සම්මාන සාමාර්ථයක් ද, දෙමළ හැන්සාඩ් වාර්තාකරුවන් සඳහා දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් ද, ඉංග්‍රීසි හැන්සාඩ් වාර්තාකරුවන් සඳහා ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ද සහිතව දෙවතාවකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ගණිතය ඇතුළුව විෂයයන් හයකට නොඅඩු සංඛ්‍යාවකින් සමත්වීම;

*හෝ*

*(ආ)* සිංහල හැන්සාඩ් වාර්තාකරුවන් සඳහා සිංහල භාෂාවට සම්මාන සාමාර්ථයක් ද, දෙමළ හැන්සාඩ් වාර්තාකරුවන් සඳහා දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් ද, ඉංග්‍රීසි හැන්සාඩ් වාර්තාකරුවන් සඳහා ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ද සහිතව එක් වතාවකදී ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගයෙන් ගණිතය ඇතුලුව විෂයයන් අටකට නොඅඩු සංඛ්‍යාවකින් සමත්වීම.

*1.4 වෘත්තීය සුදුසුකම් :*

1.4.1 *හැන්සාඩ් වාර්තාකරු (සිංහල)*

*(අ)* *ලඝුලේඛනය* - විනාඩියකට වචන 110
*යතුරු ලිවීම* - විනාඩියකට වචන 30
*(ආ)* සිංහල භාෂාව පිළිබඳ උසස් ප්‍රවීණතාව සහ පුළුල් සාමාන්‍ය දැනුම,
*(ඇ)* ඉංග්‍රීසි, දෙමළ භාෂා පිළිබඳ දැනුම හා පරිගණක භාවිතය පිළිබඳ දැනුම අමතර සුදුසුකම් වනු ඇත.

1.4.2 *හැන්සාඩ් වාර්තාකරු (දෙමළ)*

*(අ)* *ලඝුලේඛනය* - විනාඩියකට වචන 110
*යතුරු ලිවීම* -විනාඩියකට වචන 30
*(ආ)* දෙමළ භාෂාව පිළිබඳ උසස් ප්‍රවීණතාව සහ පුළුල් සාමාන්‍ය දැනුම,
*(ඇ)* ඉංග්‍රීසි, සිංහල භාෂා පිළිබඳ දැනුම හා පරිගණක භාවිතය පිළිබඳ දැනුම අමතර සුදුසුකම් වනු ඇත.

1.4.3 *හැන්සාඩ් වාර්තාකරු (ඉංග්‍රීසි)*

*(අ)* *ලඝුලේඛනය* - විනාඩියකට වචන 120
*යතුරු ලිවීම* - විනාඩියකට වචන 40
*(ආ)* ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් ප්‍රවීණතාව සහ පුළුල් සාමාන්‍ය දැනුම,
*(ඇ)* සිංහල, දෙමළ භාෂා පිළිබඳ දැනුම හා පරිගණක භාවිතය පිළිබඳ දැනුම අමතර සුදුසුකම් වනු ඇත.

*සටහන* - (i) බඳවා ගැනීමේ පරීක්ෂණවලදී හැන්සාඩ් වාර්තාකරුවන් ලෙස තේරීමට අවශ්‍ය ප්‍රවීනතාවය නොමැති අයදුම්කරුවන් කාරක සභා වාර්තාකරු තනතුර හෝ ලඝු ලේඛක තනතුර සඳහා ද බඳවා ගැනීමට සලකා බලනු ලැබේ. එම තනතුරුවලට අදාල වාර්ෂික වැටුප් පරිමාණයන් මෙසේය.

කාරක සභා වාර්තාකරු (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) -
රු. 2,47,620 - 9x 3,900/6 x 4,800- රු.3,11,520

ලඝු ලේඛක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) -
රු. 1,82,880-3 x 1,680 / 10, x 2,220/4 x 3,480-රු. 2, 24,040

(ii) එබැවින් හැන්සාඩ් වාර්තාකරු (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) තනතුර සඳහා පමණක් ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වන බව සලකන්න.

1.5 *බඳවා ගැනීමේ ක්‍රමය.-*

ලඝුලේඛනය, යතුරු ලිවීම, වාර්තා කිරීම හා භාෂාව පිළිබඳ ලිඛිත පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

1.6 *සේවයේ නියුක්ත කරවීමේ නියමයන්.-*

තෝරාගනු ලබන ඉංග්‍රීසි මාධ්‍ය අයදුම්කරුවන් පත්වීමෙන් වසරක් තුළදී 90%ක නිරවද්‍යතාව සහිතව විනාඩියකට වචන 140ක ඉංග්‍රීසි ලඝුලේඛන වේග පරීක්ෂණයකින් සමත් විය යුතුය. මෙම පරීක්ෂණයෙන් අසමත් වුවහොත් අවස්ථාවෝචිත පරිදි පත්වීම අවසන් කිරීම හෝ පෙර සේවයට නැවත යැවීම සිදුකරනු ලැබේ.

02. *සේවා කොන්දේසි .-*

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම මුලිකව තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව සිදුකරනු ලැබේ. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවයෙහි ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත්කරනු ඇත.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තු මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මුල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරාගනු ලබන අයදුම්කරුවන්, වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට ඔහුගේ/ඇයගේ වැටුපෙන් රජය විසින් තීරණය කරනු ලබන ප්‍රතිශතයකින් ද දායකත්වය ලබාදිය යුතුය.

(iv) තෝරාගත් අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

(v) තෝරාගත් අයදුම්කරුවන් පත්කිරීමට පෙර ඔහු/ඇය පිළිබඳ ආරක්ෂක නිෂ්කාශන වාර්තාවක් ලබා ගැනීම ද සිදු කරනු ඇත.

03. අයදුම්කරුවන් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ.) තම අයදුම්පතට අමුණා එවිය යුතුය. සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුත්තේ එසේ කිරීමට ඉල්ලා සිටින විට දී පමණි.

*(අ)* උප්පැන්න සහතිකය,
*(ආ)* අධ්‍යාපන සහතික,
*(ඇ)* වෘත්තීමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
*(ඈ)* පළපුරුද්ද සනාථ කෙරෙන සහතික,
*(ඉ)* මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්.

(දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් චරිත සහතික එවීම අවශ්‍ය නැත.)

04. රාජ්‍ය/පළාත් රාජ්‍ය /රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

05. කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

06. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ 'දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් හරහා එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

2008 ඔක්තෝබර් මස 17 වැනි දින,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

**හැන්සාඩ් වාර්තාකරු (..................................) තනතුර සඳහා අයදුම්පත**

01. *(අ)* මුලකුරු සමග නම : ________. මහතා/ මහත්මිය/ මෙනවිය: ___________.
*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම්: ___________.

02. *(අ)* පෞද්ගලික ලිපිනය: ___________.
දුරකථන අංකය: ___________.
*(ආ)* කාර්යාලයීය ලිපිනය: ___________.
දුරකථන අංකය: ___________.

03. (i) උපන් දිනය : ___________.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
(ii) 2008.11.10 වැනි දිනට වයස
අවුරුදු: _________. මාස: ______. දින: ___________.

04. විවාහක/අවිවාහක බව: ___________.
05. ස්ත්‍රී/පුරුෂ භාවය: ___________.
06. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු ද යන බව: ___________.
07. ජාතික හැඳුනුම්පත් අංකය: ___________.
08. අධ්‍යාපන සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුය.):

| *සමත්වූ විභාග හා වර්ෂයන්* | *විෂයයන්* | *සාමාර්ථයන්* |
|---|---|---|
| | | |

09.උසස් අධ්‍යාපන සුදුසුකම් : (සහිතකවල පිටපත් ඇමිණිය යුතුය)
(1) උපාධිය හා වර්ෂය: ___________.
(2) විශ්ව විද්‍යාලය: ___________.

10. *(අ)* ලඝු ලේඛණ වේගය: ___________.
*(ආ)* යතුරු ලියන වේගය: ___________.

11. වෘත්තීය සුදුසුකම්: (සහතික පිටපත් ඇමිණිය යුතුය.)
..........................................................................................................
..........................................................................................................

12. වත්මන් රැකියාව පිළිබඳ විස්තර: ___________.
*(අ)* ආයතනයේ නම හා ලිපිනය: ___________.
*(ආ)* දැනට දරන තනතුර : _______. පත්වූ දිනය: ________.
*(ඇ)* වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමාණය : ___________.
*(ඈ)* මාසික ඒකාබද්ධ වැටුප: ___________.
*(ඉ)* දීමනා: ___________.

13. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියකදී වැරදිකරු වී ඇත්ද ?: ___________.

එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න: ___________.

14. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේද ?: ___________.

එසේ නම් එම විස්තර හා සේවය අවසන් කිරීමට හේතු සඳහන් කරන්න: ___________.

15. පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා ඇත: ___________.

*සැ. යු.* - මෙම සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(අ) උප්පැන්න සහතිකය: ___________.
(ආ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික: ___________.
(ඇ) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික: ___________.
(ඈ) පළපුරුද්ද පිළිබඳ සහතික: ___________.
(ඉ) අයදුම්කරුගේ චරිතය පිළිබඳ මෑතකදී ලබා ගත් සහතික දෙකක් (දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රජයේ සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු, අයදුම්කරුවන් චරිත සහතික පිටපත් එවීම අවශ්‍ය නොවේ.)

ම විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරාගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සෙකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

___________,
අයදුම්කරුගේ අත්සන

දිනය: ___________.

***දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය***

(රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රජයේ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු, අයදුම්කරුවන් සඳහා පමණි.)

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ ................................................තනතුර දරන,.............................. මයා/මිය/මෙනවියගේ අයදුම්පත නිර්දේශ කර, ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/නොහැක.

___________,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය: ___________.

10-444

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2008

### ව්‍යවස්ථා සහ නිර්දේශ පත්‍රය

01. යථොක්ත විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2009 ජනවාරි මස 17 සහ පෙබරවාරි මස 14 අතර සති අන්තයක දී දිවයින පුරා පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පවත්වනු ලැබේ.

02. *විභාග මධ්‍යස්ථාන* .- උපලේඛනයේ දක්වා ඇති සෑම දිස්ත්‍රික්කයක් තුළ ම අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලැබේ.

එහෙත් යම් මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවලදී එකී විභාග මධ්‍යස්ථානය අවලංගු කොට අදාල අයදුම්කරුවන් ඊට ආසන්නව පිහිටි විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමට සිදුවනු ඇත. විභාග මධ්‍යස්ථාන පිහිටුවන දිස්ත්‍රික්ක හා නගර දැක්වෙන ලැයිස්තුව 1 වන උපලේඛනයෙහි දක්වා ඇත.

03. *භාෂා මාධ්‍යය* .- මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම පවත්වනු ලැබේ.

04. *සුදුසුකම්* .- මෙම විභාගය සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවකු ම පහත දක්වා ඇති සුදුසුකම් අතුරෙන් යටත් පිරිසෙයින් කවර හෝ එක් සුදුසුකමක් සපුරා තිබිය යුතුය.

4.1 දහම් පාසලක නව වැනි ශ්‍රේණිය සමත් වී දහම් පාසල් අවසාන සහතික පත්‍ර පන්තියේ යටත් පිරිසෙයින් වර්ෂයක් හෝ ඉගෙනුම් කටයුතුවල නිරත වීම;

*හෝ*

4.2 ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් බුද්ධ ධර්මය ඇතුලුව විෂයයන් හයකින් සමත් වී සිටීම හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් බුද්ධ ධර්මය සහිතව සමත් වී සිටීම;

*හෝ*

4.3 කොළඹ තරුණ බෞද්ධ සංගමය මගින් පවත්වන ලද බෞද්ධ ශික්ෂා විභාගයේ ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සමත් වී සිටීම.

සටහන .- (i) මෙම විභාගය සඳහා ඉදිරිපත් වන සෑම අයදුම්කරුවකු ම ඉහත 4 වැනි ඡේදයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති බවට දහම් පාසල් ප්‍රධානාචාර්යවරයකු, පරිවේණාධිපතිවරයකු හෝ විද්‍යාලයාධිපතිවරයෙකු විසින් සහතික කළ යුතුය.

(ii) විභාගාපේක්ෂකයන්ට මෙම විභාගය සඳහා ඉදිරිපත් විය හැක්කේ දහම් පාසල් අයදුම්කරුවකු වශයෙන් පමණකි.

*05. අයදුම් කිරීම.* -

5.1 දහම් පාසල් අයදුම්කරුවන් - පසුගිය වසරේ සිසුන් ඉදිරිපත් කළ සියලු ම දහම් පාසල් වෙත ප්‍රමාණවත් ඉල්ලුම්පත්‍ර සහ උපදෙස් පත්‍රිකා තැපැල් මගින් එවීමට කටයුතු සලසා ඇත. අයදුම්පත් නොලැබුණු හෝ 2007 වසරේ විභාගයට ඉල්ලුම් නොකළ හෝ යම් දහම් පාසලක් වේ නම්, දහම් පාසලේ නම, ලිපිනය, ඉදිරිපත් කරන අයදුම්කරුවන් ගණන යනාදි විස්තර සඳහන් කොට මෙහි 5.6 වන ඡේදයේ සඳහන් ලිපිනයට 2008.10.31 වන දිනට පෙර දැන්විය යුතු ය.

5.2 බාහිර අයදුම්කරුවන් - 1999 වසරේ සිට බාහිර අයදුම්කරුවන් ලෙස කිසිදු අපේක්ෂකයකුට මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. එසේ වුවත්, ඉහත 4 වැනි ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති යම් විභාගාපේක්ෂකයකු වේ නම්, තමන් පදිංචි ස්ථානයට ආසන්න දහම් පාසල මගින් රුපියල් 100/-ක විභාග ගාස්තුවක් ගෙවා විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැකි ය. මේ සඳහා අවශ්‍ය උපදෙස් සියලු ම දහම් පාසල් වෙත ලබා දෙනු ඇත.

5.3 අදාළ දහම් පාසල් ප්‍රධානීන් විසින් ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් පිටපත් දෙකකින් යුතුව සකස් කර මුල් පිටපත විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු අතර, අනෙක් පිටපත දහම් පාසල් ප්‍රධානියා වෙත තබා ගත යුතුය. අයදුම්පත්‍ර දෙකෙහිම ප්‍රධානාචාර්යවරයා අත්සන් කර තිබිය යුතුය.

5.4 අයදුම්පත්‍ර භාරගැනීමේ අවසාන දිනය 2008.11.14 වැනි දින වේ.

5.5 අයදුම්පත් පැහැදිලිව ද, නිවැරදිව ද සම්පූර්ණ කළ යුතුය. එසේ නොවන අයදුම්පත් සහ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.6 දහම් පාසලේ ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු අතර, ලිපිනය වෙනස් වී නම් එය දැන්විය යුතුය. දුරකථන පහසුකම් ඇත්නම් එම අංකය ද සඳහන් කරන්න. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් ලැබුන බව දන්වා එවනු නොලැබේ.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

5.7 අයදුම්පත් බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ 'දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2008' යනුවෙන් ද ඉල්ලුම් කරන නගරය ද සඳහන් කළ යුතු ය.

5.8 කිසිම සහතිකයක් අයදුම්පත් සමග අමුණා එවීම අවශ්‍ය නොවේ.

5.9 අයදුම්කරුවන්ගේ අදාළ සහතික පිළිබඳවත් සුදුසුකම් ලබා තිබීම පිළිබඳවත් අයදුම්පත් සහතික කරන පරිවේණාධිපති ස්වාමීන් වහන්සේ, ප්‍රධානාචාර්යවරයා හෝ විද්‍යාලයාධිපතිවරයා වගකීමට බැඳෙනු ඇත.

6. *විභාග ගාස්තු* - මෙම විභාගය සඳහා නියමිත සම්පූර්ණ විභාග ගාස්තුව රුපියල් 100/කි. එහෙත් ප්‍රථම වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් මෙම විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ. ඌන සාමාර්ථය සම්පූර්ණ කිරීම සඳහා වන විෂයය සඳහා විභාග ගාස්තුව රු. 50 කි.

6.1 *විභාග ගාස්තු ගෙවීම.*- දහම් පාසල් ප්‍රධානාචාර්ය විසින් විභාග ගාස්තු ගෙවීමට නියමිත සියලු ම අයදුම්කරුවන්ගේ විභාග ගාස්තු එකතු කොට, දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයට එම මුදල ගෙවා, එක් ලදු පතක් ලබාගෙන, එම ලදු පත අයදුම්පත්‍රයේ පසු පිටේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. (මුද්දර හා මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.)

6.2 *විභාග ගාස්තු ආපසු ගෙවීම.*- කුමන කරුණක් නිසාවත් මෙම විභාගය සඳහා ගෙවන ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් හෝ සිදු කරනු ලැබේ.

7. *ප්‍රවේශ පත්‍ර* .- විභාගයට ඇතුළත් කරගන්නා සෑම අයදුම්කරුවකු වෙතම විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක්, ඉල්ලුම්පත් ඉදිරිපත් කළ දහම් පාසල් ප්‍රධානාචාර්ය මගින් නිකුත් කරනු ඇත.

7.1 විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකු විසින් ම ස්වකීය ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගෙන, විභාගයට පෙනී සිටින ප්‍රථම අවස්ථාවේදී ම විභාග ශාලාධිපති වෙත භාරදිය යුතුය. යම් අයදුම්කරුවකු තම ප්‍රවේශ පත්‍රය භාර නොදී සිටී නම් හා විභාග කොමසාරිස් ජනරාල් විසින් තමාට නියම කරන විභාග මධ්‍යස්ථානය හැර වෙනත් විභාග මධ්‍යස්ථානයක දී විභාගයට පෙනී සිටී නම්, ඔහුගේ විභාග අපේක්ෂකත්වය අහෝසි වනු ඇත.

7.2 ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන, දහම් පාසල් ප්‍රධානාචාර්යවරයකු හෝ පරිවේණාධිපති ස්වාමීන් වහන්සේ නමක හෝ රජයේ විද්‍යාලයාධිපතිවරයකු හෝ වර්ෂයකට රුපියල් 2,30,700/ - කට වැඩි ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර සේවයෙහි නියුතු නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

7.3 විභාගය පැවැත්වීමට දින 07 කට පෙර ප්‍රවේශපත්‍රයක් නොලැබුණහොත්, එකී දහම් පාසල් ප්‍රධානියා විසින් ඒ බව නොපමාව විභාග කොමසාරිස් ජනරාල් වෙත දැන්විය යුතුය. එවැනි සෑම අවස්ථාවකදී ම පහත සඳහන් විස්තර සැපයිය යුතුය.

1. විභාගයේ නම ;
2. දහම් පාසලේ නම ;
3. දහම් පාසලට ලබා දී ඇති පරිගණක අංකය ;
4. සම්පූර්ණ නම හා ලිපිනය ;
5. ඉල්ලුම් කළ විභාග මධ්‍යස්ථානය/ නගරය ;
6. ඉල්ලුම්පත්‍ර තැපැල් කළ තැපැල් කාර්යාලය ;
7. ලියාපදිංචි කළ අංකය හා දිනය ;
8. විභාග ගාස්තු ගෙවා ඇත්නම් එම ලදුපතේ අංකය, දිනය හා තැපැල් කාර්යාලය.

8. *හැඳුනුම්පත* .- එක් එක් විෂයයට පෙනී සිටින සෑම අවස්ථාවේදී ම විභාග ශාලාධිපතිට පිළිගත හැකි වන පරිදි අපේක්ෂකයන් විසින් තමන්ගේ අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා සූදානම්ව පැමිණිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

8.1 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

8.2 වලංගු විදෙස් ගමන් බලපත්‍රය,

8.3 සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන භික්ෂු හැඳුනුම් පත

9. *සමත් බව තීරණය කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම.-* මෙම විභාගය සඳහා නියමිත විෂයයන් ගණන හතරක් වන අතර, විභාගයෙන් සාමාර්ථය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයකුම එම විෂයන් හතරෙන් ම සමත් විය යුතුය. කෙසේ වෙතත් එක් වතාවකදී අදාළ විෂයය හතරෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් එය ඌන සාමාර්ථ්‍යයක් ලෙස සලකනු ලැබේ. විභාගයේ ප්‍රතිඵල නිකුත් කළ දින සිට අනුගාමී වසර දෙකක් (02) ඇතුළත එම ඌන සාමාර්ථය ලැබූ විෂයය සඳහා නැවත පෙනී සිට එය සමත් වී ඌන සාමාර්ථය සම්පූර්ණ කළ හැකි ය. (මෙය 2007 වසරේ විභාගයේ සිට බලපැවැත් වේ.)

9.1 අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලැයිස්තු අදාළ දහම් පාසල් ප්‍රධානීන් වෙත තැපැල් මගින් එවනු ලැබේ.

10. *සහතික පත්‍ර.-* මෙම විභාගයෙන් සමත් වන සෑම අයදුම්කරුවකුට ම සහතික පත්‍රයක් නිකුත් කිරීමට විධිවිධාන යොදනු ලැබේ.

11. *උත්තර පත්‍ර නැවත සමීක්ෂණය .-* දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන්ගේ ඉල්ලීම් මත පමණක් උත්තරපත්‍ර නැවත සමීක්ෂණයට ඉඩ දෙනු ලැබේ. විභාගයේ ප්‍රතිඵල නිකුත් වී දින 30ක් ඇතුළත මෙම දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයකින් උත්තරපත්‍ර නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ යුතුය. මේ සඳහා වන ගාස්තු ප්‍රමාණයන් වරින් වර සංශෝධනය වීමට ඉඩ ඇති බැවින්, එය අදාළ අයදුම්පතෙහි දක්වනු ලැබේ. මෙම ගාස්තු ආපසු ගෙවනු ලබන්නේ මුලින්ම දෙන ලද ප්‍රතිඵලයක වෙනසක් කිරීමට සිදුවුවහොත් පමණකි. කවර හේතුවක් නිසාවත් අයදුම්කරුවන්ට හෝ ඔහුගේ නියෝජිතයින්ට උත්තර පත්‍ර පරීක්ෂා කර බැලීමට ඉඩදෙනු නොලැබේ.

12. මෙම ව්‍යවස්ථා සහ විෂය නිර්දේශ සංග්‍රහයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට සියලු ම විභාග අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි විධිවිධාන සලසා නැති කවර හෝ යම් කරුණක් වෙතොත් එය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය වනු ඇත.

අනුර එදිරිසිංහ,
විභාග කොමසාරිස් ජනරාල්.

2008 ඔක්තෝබර් මස 02 වැනි දින,
පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

**විභාග විෂයය හා විෂය නිර්දේශය**

(1993 සිට ඉදිරියට පැවැත්වෙන විභාග සඳහා)

මෙම විභාගය පැය 03 බැගින් වූ ප්‍රශ්න පත්‍ර 4 කින් සමන්විතය.

***1 වැනි ප්‍රශ්න පත්‍රය***

බුද්ධ චරිතය

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්තයි.

1 වැනි කොටස

බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි පැවති භාරතීය සමාජය අවබෝධකර ගැනීම.-

(අ) සාමාජික පසුබිම
(ආ) දේශපාලනික පසුබිම
(ඇ) ආර්ථික පසුබිම
(ඈ) ආගමික හා දාර්ශනික පසුබිම

*II වන කොටස - බුද්ධ චරිතය*

(අ) සිද්ධාර්ථ කුමාරෝත්පත්තියේ සිට සම්බුද්ධ පරිනිර්වාණය තෙක් බුද්ධ චරිතය.
(ආ) බුද්ධ චරිතයේ කැපී පෙනෙන විශිෂ්ඨ ලක්ෂණ -තාදී ගුණය, අසරණයන්ට පිහිටවීම, ගිලනුවන්ට උපස්ථාන කිරීම, හික්මවිය යුතු පුද්ගලයන් හික්මවීම, ඉවසීම, අන්‍යයමත ඉවසීම
(ඇ) බුදුරජාණන් වහන්සේගේ ලොව්තුරු ගුණ
(ඈ) බුදුරාජාණන් වහන්සේගේ සමාජ ශෝධකත්වය
(ඉ) බුදුරාජාණන් වහන්සේගේ නායකත්වය.

*III වන කොටස - බුදුරජාණන් වහන්සේගේ සිව්වණක් පිරිස*

(අ) භික්ෂු - පස්වග භික්ෂූන්, සැරියුත් මුගලන්, මහා කාශ්‍යප, ආනන්ද, සිවලී, මහා කච්චාන, පුණ්ණමන්තානි පුත්ත, කුමාර කාශ්‍යප යන රහතන් වහන්සේ පිළිබඳ දැනුම.

(ආ) භික්ෂුණී -මහා ප්‍රජාපතී ගෝතමී, ඛේමා, උප්පලවණ්ණා, භද්දකච්චානා, ධම්මදින්නා, අම්බපාලී, පටාචාරා යන තෙරණින් වහන්සේ පිළිබඳ දැනුම.

(ඇ) උපාසක - සේනිය, බිම්බිසාර, පසේ නදී කෝසල, අජාසත් ,අනාථ පිණ්ඩික, ධම්මික යන උපාසකවරුන් පිළිබඳ දැනුම
(ඈ) උපාසිකා - විශාඛා, කෝසල මල්ලිකා, සාමාවතී, ඛුජ්ජුත්තරා යන උපාසිකාවන් පිළිබඳ දැනුම.

**2 වැනි ප්‍රශ්න පත්‍රය**

බුද්ධ ධර්මය හා පාලි භාෂා පරිචය

මෙම ප්‍රශ්ණ පත්‍රය කොටස් තුනකින් සමන්විතය.

*I වන කොටස -බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම*

(අ) පටිච්ඡ සමුප්පාදය
(ආ) චතුරාර්ය සත්‍යය
(ඇ) ත්‍රිලක්ෂණය
(ඈ) කර්මය සහ පුනර්භවය
(ඉ ) නිර්වාරණය

මෙම ධර්ම කරුණු පිළිබඳව ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදායයෙහි අර්ථ විවරණය පිළිබඳ සාමාන්‍ය අවබෝධය.

*II වන කොටස - භාවනා සහ අභිධර්මය*

(අ) සමථ, විපස්සනා භාවනා
(ආ) අභිධර්මයෙහි සතර පරමාර්ථ ධර්ම පිළිබඳ සාමාන්‍ය දැනුම

*II* වන කොටස - ශ්‍රී ලංකාවේ බෞද්ධ කලා ශිල්ප

බුදුදහමෙන් සිදු වූ කලා පෝෂණය
බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පය (ස්ථූප, චෛතියඝර, බෝධිඝර, පඨමාඝර)

*බෞද්ධ මූර්ති, කැටයම් හා චිත්‍ර කලාව*

( *i*) බුදු පිළිමය - උපත හා ව්‍යාප්තිය , අනුරාධපුර සමාධි පිළිම, තොලුවිල සමාධි පිළිමය, අවුකන බුදු පිළිමය, ගල් විහාරේ බුදු පිළිම
(*ii*) කැටයම් - වාහල්කඩ, සඳකඩ පහන, මුරගල්, කොරවක්ගල් හා පියගැට
(*iii*) බෞද්ධ චිත්‍ර කලාව- අනුරාධපුර, පොළොන්නරුව හා මහනුවර යුගයේ බිතුසිතුවම් (මහියංගන ධාතු ගර්භය, තිවංක පිළිමගේ, දෙගල්දොරුව, කැළණියේ අළුත් විහාරය, ගෝතමී විහාරය යන ස්ථානවල බිතු සිතුවම් )

*III වන කොටස - සිංහල බෞද්ධ සාහිත්‍ය*

බෞද්ධ කථා සාහිත්‍යයේ ආචාර, විද්‍යාත්මක වටිනාකම, ජාතක පොත සද්ධර්ම රත්නාවලිය හා පූජාවලිය පිළිබඳ සාමාන්‍ය දැනීම.

*සිංහල භක්ති කාව්‍ය* - බුදුගුණ අලංකාරය හා තුන් සරණය පිළිබඳ සාමාන්‍ය දැනීම.

*IV වන කොටස ලෝක බෞද්ධ සංස්කෘතිය*

පහත සඳහන් රටවලට බුද දහම පැමිණීම, ව්‍යාප්තිය හා බෞද්ධ සංස්කෘතික ලක්ෂණ පිළිබඳ සාමාන්‍ය දැනීම ඃ

(*අ*) මියන්මාර් (බුරුමය)
(*ආ*) තායිලන්තය
(*ඇ*) චීනය
(*ඈ*) ජපානය

*පරිශීලනය කළ යුතු ග්‍රන්ථ*
බෞද්ධ සංස්කෘතිය - සිරි සීවලී හිමි
කලා ශිල්ප හා සාහිත්‍ය - ඩී. ආර්. ජයවර්ධන
අතිරේක කියවීම් පොත්
බුදු සිරිත - කේ. ඩී. පී. වික්‍රමසිංහ

***III වන කොටස - පාලි භාෂා පරිචය***

පහත සඳහන් ගාථා සහ පාඨ සිංහලට පරිවර්තනය කිරීම .-

(*අ*) ධම්මපදය - යමක වග්ග 19, 20 ගාථා, පුප්ඵ වග්ග, 03 ගාථාව, බාල වග්ග - 05, 06, 10, 14, 15,
ගාථා, පණ්ඩිත වග්ග 12, 13, 14 ගාථා.

(*ආ*) චතු භාණවාර පාලි -

(i) මිත්තානිසංස සුත්ත
(ii) මෙත්තානිසංස සුත්ත
(iii) ඛන්ධ පරිත්ත

(*ඇ*) රසවාහිණී - දිට්ඨ ගාමිණී අභය මහාරඤ්ඤවත්ථු
(*ඈ*) වන්දනා ගාථා සහ පාඨ

(i) තෙරුවන් ගුණ පාඨ සහ වන්දනා ගාථා
(ii) ආමිස පූජා ගාථා

**3 වැනි ප්‍රශ්න පත්‍රය**
ශාසන ඉතිහාසය

*මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තයි*

(i) භාරතීය ශාසන ඉතිහාසය
(ii) ශ්‍රී ලංකා ශාසන ඉතිහාසය

*I වන කොටස - භාරතීය ශාසන ඉතිහාසය*

(*අ*) බෞද්ධ ධර්මදූත සේවාවේ ආරම්භය සහ බුද්ධ කාලීන ශාසන ව්‍යාප්තිය
(*ආ*) ධර්ම සංගායනා සතර
(*ඇ*) අශෝක සමය
(*ඈ*) අශෝක රජතුමා බෞද්ධයකු වීම
(*ඉ*) අශෝක ධර්මය
(*ඊ*) අශෝක රජුගේ ලෝක ශාසනික සේවාව,
(*උ*) බෞද්ධ ඉතිහාසයේ අශෝක රජතුමාට හිමි තැන අගය කිරීම

*II වන කොටස - ශ්‍රී ලංකා ශාසන ඉතිහාසය*

(*අ*) මහින්දාගමනය සහ බුද්ධ ශාසන ප්‍රතිෂ්ඨාපනය
(*ආ*) භික්ෂුණී සමාජය
(*ඇ*) ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කරවීම
(*ඈ*) දන්ත ධාතුන් වහන්සේ වැඩම කරවීම
(*ඉ*) මහා විහාරය
(*ඊ*) අභයගිරි විහාරය
(*උ*) ජේතවන විහාරය
(*ඌ*) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම
(*එ*) බුදු සමයෙන් ලක්වැසියන් ලද ආභාෂය

**4 වැනි ප්‍රශ්න පත්‍රය**

බෞද්ධ සංස්කෘතිය

මෙම ප්‍රශ්න පත්‍රය බෞද්ධ සිරිත් විරිත්, ශ්‍රී ලංකාවේ කලා ශිල්ප හා ලෝක බෞද්ධ සංස්කෘතික යන කොටස් තුනකින් යුක්ත වෙයි.

*I වන කොටස - බෞද්ධ සිරිත් විරිත්*

(*අ*) බෞද්ධ සිරිත් විරිත්වල වැදගත්කම
(*ආ*) බෞද්ධ ආරාම (පැවිදි) ජීවිතය ආශ්‍රිත සිරිත් විරිත්
(*ඇ*) ආරාම ජීවිතය පදනම් වූ බෞද්ධ ගිහි සිරිත් විරිත්
(*ඈ*) ගිහි පවුල් ජීවිතය සම්බන්ධ සිරිත් විරිත්
(*ඉ*) ශාසනික කටයුතු පිළිබඳ සිරිත් විරිත්

(සාංඝික දාන, කඨින දාන, ධර්ම දේශනා හා ධර්ම ශ්‍රවණ, පිරිත් පින්කම් හා බෝධි පූජා) බෞද්ධ උත්සව

I *උපලේඛනය*

ඒ ඒ දිස්ත්‍රික්කයන්හි විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක

**දිස්ත්‍රික්කය - කොළඹ 01**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොටහේන | 101 |
| මරදාන | 102 |
| බොරැල්ල | 103 |
| ගල්කිස්ස | 104 |
| බම්බලපිටිය | 105 |
| දෙහිවල | 106 |
| නුගේගොඩ | 107 |
| මොරටුව | 108 |
| පිළියන්දල | 109 |
| හෝමාගම | 110 |

**දිස්ත්‍රික්කය - කොළඹ 01**

| නගරය | නගර අංකය |
|---|---|
| මහරගම | 111 |
| අවිස්සාවේල්ල | 112 |

**දිස්ත්‍රික්කය - ගම්පහ 02**

| නගරය | නගර අංකය |
|---|---|
| ගම්පහ | 213 |
| මිනුවන්ගොඩ | 214 |
| මීරිගම | 215 |
| වේයන්ගොඩ | 216 |
| මීගමුව | 217 |
| වත්තල | 218 |
| කැළණිය | 219 |

**දිස්ත්‍රික්කය - කළුතර 03**

| නගරය | නගර අංකය |
|---|---|
| කළුතර | 320 |
| පානදුර | 321 |
| හොරණ | 322 |
| මතුගම | 323 |
| අළුත්ගම | 324 |
| මීගහතැන්න | 325 |

**දිස්ත්‍රික්කය - මාතලේ 04**

| නගරය | නගර අංකය |
|---|---|
| මාතලේ | 426 |
| ගලේවෙල | 427 |
| නාඋල | 428 |
| ලග්ගල - පල්ලේගම | 429 |
| දඹුල්ල | 430 |

**දිස්ත්‍රික්කය - මහනුවර 05**

| නගරය | නගර අංකය |
|---|---|
| මහනුවර | 531 |
| කටුගස්තොට | 532 |
| තෙල්දෙනිය | 533 |
| වත්තේගම | 534 |
| ගලහ | 535 |
| නුගවෙල | 536 |
| ගලගෙදර | 537 |
| ගම්පොළ | 538 |
| පිළිමතලාව | 539 |
| මැද මහනුවර | 540 |
| නාවලපිටිය | 541 |

**දිස්ත්‍රික්කය - නුවරඑළිය 06**

| නගරය | නගර අංකය |
|---|---|
| නුවරඑළිය | 642 |
| හැඳුණුවැව | 643 |
| හැටන් | 644 |
| ගිනිගත්හේන | 645 |

**දිස්ත්‍රික්කය - මහනුවර 06**

| නගරය | නගර අංකය |
|---|---|
| හඟුරන්කෙත | 646 |
| වලපනේ | 647 |

**දිස්ත්‍රික්කය - ගාල්ල 07**

| නගරය | නගර අංකය |
|---|---|
| ගාල්ල | 748 |
| අම්බලන්ගොඩ | 749 |
| ඇල්පිටිය | 750 |
| උඩුගම | 751 |
| අහංගම | 752 |
| බද්දේගම | 753 |
| බලපිටිය | 754 |

**දිස්ත්‍රික්කය - මාතර 08**

| නගරය | නගර අංකය |
|---|---|
| මාතර | 855 |
| වැලිගම | 856 |
| කඹුරුපිටිය | 857 |
| හක්මණ | 858 |
| දික්වැල්ල | 859 |
| අකුරැස්ස | 860 |
| දෙනියාය | 861 |

**දිස්ත්‍රික්කය - හම්බන්තොට 09**

| නගරය | නගර අංකය |
|---|---|
| හම්බන්තොට | 962 |
| වලස්මුල්ල | 963 |
| වීරකැටිය | 964 |
| තංගල්ල | 965 |
| අම්බලන්තොට | 966 |
| බෙලිඅත්ත | 967 |
| තිස්සමහාරාමය | 968 |
| අගුණකොළපැලැස්ස | 969 |

### දිස්ත්‍රික්කය - වව්නියාව 10

| නගරය | නගර අංකය |
|---|---|
| වව්නියාව | 1070 |

### දිස්ත්‍රික්කය - ත්‍රිකුණාමලය 11

| නගරය | නගර අංකය |
|---|---|
| ත්‍රිකුණාමලය | 1171 |
| කන්තලේ | 1172 |

### දිස්ත්‍රික්කය - අම්පාර 12

| නගරය | නගර අංකය |
|---|---|
| අම්පාර | 1273 |
| සේරංකඩ | 1274 |
| මහඔය | 1275 |
| දෙහිඅත්තකණ්ඩිය | 1276 |

### දිස්ත්‍රික්කය - පුත්තලම 13

| නගරය | නගර අංකය |
|---|---|
| පුත්තලම | 1377 |
| ආණමඩුව | 1378 |
| හලාවත | 1379 |
| වෙන්නප්පුව | 1380 |

### දිස්ත්‍රික්කය - කුරුණෑගල 14

| නගරය | නගර අංකය |
|---|---|
| කුරුණෑගල | 1481 |
| පොල්ගහවෙල | 1482 |
| කුලියාපිටිය | 1483 |
| ඉබ්බාගමුව | 1484 |
| මැල්සිරිපුර | 1485 |
| හෙට්ටිපොල | 1486 |
| නිකවැරටිය | 1487 |
| මහව | 1488 |
| ගල්ගමුව | 1489 |

### දිස්ත්‍රික්කය - අනුරාධපුරය 15

| නගරය | නගර අංකය |
|---|---|
| අනුරාධපුරය | 1590 |
| මැදවච්චිය | 1591 |
| කැකිරාව | 1592 |
| පදවිය | 1593 |
| ගලෙන්බිඳුණුවැව | 1594 |
| තඹුත්තේගම | 1595 |
| හොරොව්පතාන | 1596 |
| නොච්චියාගම | 1597 |

### දිස්ත්‍රික්කය - පොළොන්නරුව 16

| නගරය | නගර අංකය |
|---|---|
| පොළොන්නරුව | 1698 |
| මනම්පිටිය | 1699 |
| හිගුරක්ගොඩ | 1600 |
| මැදිරිගිරිය | 1601 |

### දිස්ත්‍රික්කය - බදුල්ල 17

| නගරය | නගර අංකය |
|---|---|
| බදුල්ල | 1702 |
| වැලිමඩ | 1703 |
| බණ්ඩාරවෙල | 1704 |
| පස්සර | 1705 |
| මහියංගනය | 1706 |
| ගිරාදුරුකෝට්ටෙ | 1707 |
| මීගහකිවුල | 1708 |

### දිස්ත්‍රික්කය - මොණරාගල 18

| නගරය | නගර අංකය |
|---|---|
| මොණරාගල | 1809 |
| බිබිල | 1810 |
| වැල්ලවාය | 1811 |
| කතරගම | 1812 |
| දොඹගහවෙල | 1813 |

### දිස්ත්‍රික්කය - කෑගල්ල 19

| නගරය | නගර අංකය |
|---|---|
| කෑගල්ල | 1914 |
| අරණායක | 1915 |
| රඹුක්කන | 1916 |
| මාවනැල්ල | 1917 |
| රුවන්වැල්ල | 1918 |
| යටියන්තොට | 1919 |
| වරකාපොල | 1920 |

### දිස්ත්‍රික්කය - රත්නපුරය 20

| නගරය | නගර අංකය |
|---|---|
| රත්නපුර | 2021 |
| ඇහැලියගොඩ | 2022 |
| පැල්මඩුල්ල | 2023 |
| බලංගොඩ | 2024 |
| ඇඹිලිපිටිය | 2025 |
| රක්වාන | 2026 |
| කලවාන | 2027 |

**වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**ජාතික වෘත්තීය පුහුණු ආයතනය - රත්මලාන**

2009 වර්ෂය සඳහා ආධුනික ආධුනිකාවන් බඳවා ගැනීම

පහත දැක්වෙන පාඨමාලා සඳහා ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අංක | පාඨමාලාව (පූර්ණ කාලීන) | පාඨමාලා කාලය | | ගාස්තුව රු. |
|---|---|---|---|---|
| | | ආයතනික පුහුණුව මාස | සැබෑ වැඩ බිම් පුහුණුව මාස | |
| 01 | මෝටර් කාර්මික ශිල්පී - NVQ Level 4 (Automobile Mechanic) | 12 | 12 | 5,000 |
| 02 | පෑස්සුම් ශිල්පී - NVQ Level 4 (Welder) | 12 | 12 | 2,000 |
| 03 | යන්ත්‍ර ශිල්පී - NVQ Level 3 (Machinist) | 12 | 12 | 2,000 |
| 04 | ගුවන් විදුලි හා රූපවාහිනී අළුත්වැඩියාව (Radio, TV & Allied Equipment Repairer) - - NVQ Level 4 | 12 | 12 | 5,000 |
| 05 | විදුලි කාර්මික ශිල්පී - NVQ Level 3 (Electrician) | 12 | 12 | 2,500 |
| 06 | ශීතකරණ හා වායු සමීකරණ කාර්මික ශිල්පී (Ref. & Air Conditioning) - - NVQ Level 3 | 12 | 12 | 2,000 |
| 07 | කර්මාන්ත ශාලා උපකරණ තාක්‍ෂණ ශිල්පී (Industrial Instrument Technician) | 12 | 12 | 12,000 |
| 08 | වඩු කාර්මික ශිල්පී - NVQ Level 4 (Carpenter - Furniture) | 12 | 12 | නොමිලේ |
| 09 | මෝටර් රථ පිංතාරු ශිල්පී - NVQ Level 3 (Automobile-Painter) | 06 | 06 | නොමිලේ |
| 10 | මෝටර් රථ වෑද්දුම් ශිල්පී - NVQ Level 3 (Automobile - Tinker) | 06 | 06 | නොමිලේ |
| 11 | ඇළුමිනියම් පිරිසැකසුම් කාර්මික ශිල්පී (Aluminium Fabricator) - NVQ Level 3 | 06 | 06 | 1,500 |
| 12 | කාර්යාල උපකරන අළුත්වැඩියාව (Office Equipment & Repair) | 12 | 12 | 10,000 |
| 13 | ජංගම දුරකථන අළුත්වැඩියාව (Mobile Phone Repair) | 06 | 06 | 6,000 |
| 14 | බහුවිධ නිපුණතා ශිල්පී (Multi Skilled) | 12 | 24 | 3,000 |
| 15 | ප්‍රමාණ සමීක්‍ෂණ (Quantity Surveyor) | 06 | 18 | 15,000 |
| 16 | පරිගණක දෘඩාංග ශිල්පී NVQ level 3 (Computer Hard Wear Technician) | 06 | 06 | 10,000 |
| 17 | පරිගණක යෙදුම් සහායක - NVQ Level 3 (Computer Application Assistant) | 06 | 06 | 3,000 |
| 18 | පෙර පාසල් සහායිකා සහ ළදරු රැකවරණ පාලිකා Pre School Assistant & Day Care) | 06 | 06 | 3,000 |
| 19 | ලේකම් පරිචය Secretarial Practice | 06 | 06 | 6,000 |
| 20 | පුවත්පත් ලේඛන කලාව (Journalism) | 12 | 06 | 7,500 |

**අර්ධ කාලීන පාඨමාලා**

| | | | | |
|---|---|---|---|---|
| 01 | පෙර පාසල් ගුරු පුහුණුව Pre School Teacher Training (අ. පො. ස. (සා. පෙළ.), (උ. පෙ.) සමත් අය සඳහා) | 12 | 12 | 12,000 |
| 02 | වෘත්තීය ඉංග්‍රීසි (Professional English) අ. පො. ස. (සා. පෙ.), (උ. පෙ.) හැදෑරූ සිසුන්ට විශේෂයි | පැය 100 | - | 3,500 |

**පූර්ණ කාලීන පාඨමාලා හැදෑරීම සඳහා අවශ්‍ය සුදුසුකම් :**

* අයදුම්පත් ඉදිරිපත් කිරීමේ වයස් සීමාව - අවුරුදු 16 - 35 අතර වේ.

* අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

* පාඨමාලා අංක 01, 03, 04, 05 සහ 06 පාඨමාලා සඳහා අ. පො. ස. (සා. පෙ.) ගණිතය, විද්‍යාව සමග විෂයන් 06කින් සමත් වී තිබිය යුතුයි.
* පාඨමාලා අංක 07 සහ 15 සඳහා ගණිත හෝ විද්‍යා අංශයෙන් අ. පො. ස. (උ. පෙ.) හදාරා තිබීම හෝ සා. පෙළ ගණිතය හා විද්‍යාව විෂයන්ට A හෝ B සාමාර්ථ ලබා තිබීම
* පාඨමාලා අංක 16, 17 සහ 19 සඳහා අ. පො. ස. (සා. පෙ) ඉංග්‍රීසි විෂයට සම්මාන සාමාර්ථයක් සමග විෂයන් 06 කින් සමත්ව තිබිය යුතුයි.
* අපේක්‍ෂකයාගේ දැනුම, ආකල්ප හා කුසලතා පදනම් කර ගෙන ඒ ඒ පාඨමාලා සඳහා අධ්‍යාපන සුදුසුකම් ලිහිල් කිරීමද සලකා බලනු ලැබේ.
* අනෙකුත් සියළුම පාඨමාලා සඳහා 9 ශ්‍රේණිය සමත් වීම, අ. පො. ස. (සා. පෙළ.) පෙනී සිටීම වුවද ප්‍රමාණවත් වේ.

ඉහත පාඨමාලා හදාරණ ඔබට, ඔබේ දරුවාට පුහුණු කාලය තුළ ලැබෙන පහසුකම් :-

* දුෂ්කර දුර බැහැර පෙදෙස්වල ආධුනිකයින් සඳහා නේවාසික පහසුකම්,
* අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා ශිෂ්‍යත්ව,
* රැකියා ලොව ඉහල පිළිගැනීමට ලක් වූ වෘත්තීය නිපුණතා මට්ටමේ සහතිකය (රජයේ පිළිගත් වෘත්තීය පුහුණු සහතිකයක්),
* වෘත්තීය මර්ගෝපදේශනය සහ ව්‍යවසායකත්ව දැනුම,
* ස්වයං රැකියා ආරම්භ කරන්නන් සඳහා ණය පහසුකම්,
* සහනදායී මිලට ලංගම මගී වාර ප්‍රවේශ පත්‍ර,
* නායකත්වය හා සෞඛ්‍ය පුහුණු වැඩසටහන්,
* සෑම පාඨමාලාවකටම නොමිලේ ඉංග්‍රීසි අධ්‍යාපනය.

*විශේෂයි* :

* සම්පූර්ණ පුහුණු පාඨමාලා කාලයෙන් මාස 06ක් රැකියා සම්බන්ධ පුහුණුව,
* පුහුණුවෙන් පසු අනිවාර්යෙන්ම රැකියාවක්,
* කාන්තා අයදුම්කාරියන් සඳහා ප්‍රමුඛත්වය,
* දුර බැහැර පෙදෙස්වල අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය.

පාඨමාලා සඳහා අයදුම්පත් යොමු කිරීම :

ඉල්ලුම් කරන පාඨමාලාව සඳහන් කර ඔබේ පෞද්ගලික තොරතුරු, දක්‍ෂතා, රුචිකත්වයන් ඇතුලත් කර ඔබ විසින්ම සකස් කරන ලද අයදුම්පතක් 2008.11.21 දිනට ප්‍රථම පහත ලිපිනයට යොමු කරන්න.

සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.

සහකාර අධ්‍යක්‍ෂ,
ජාතික වෘත්තීය පුහුණු ආයතනය,
අංක 100, කඳවල පාර,
රත්මලාන.
දුරකථන අංක : 0112638850.

*"ජීවිතයට හැකියාවක් හැකියාවට රැකියාවක්"*

10-441

---

## විගණකාධිපති දෙපාර්තමේන්තුව

### විගණන පරීක්ෂක සේවයේ II වන ශ්‍රේණියට විගණන පරීක්ෂකවරුන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2008

විගණන පරීක්ෂක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 06 (ii) (ආ) වන ඡේදයේ විධිවිධාන අනුව එම සේවයේ II වන ශ්‍රේණියේ විගණන පරීක්ෂක තනතුරුවලට සුදුස්සන් තෝරා ගැනීම සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් තරග විභාගයක් පවත්වනු ලබන අතර, මෙම නිවේදනයේ දක්වා ඇති පරිදි අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

01. *විභාග දිනය* .- විභාග කොමසාරිස් ජනරාල් විසින් 2008 නොවැම්බර් මස කොළඹ දී හා යාපනයේ දී විභාගය පවත්වනවා ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම්කරන නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

02. *පත්කරනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය*:- පත්වීම් ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම *හෝ නොපිරවීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.*

03. *සේවා කොන්දේසි* :

(i) සාමාන්‍ය ගැසට් පත්‍රයේ I වන කොටස (IIආ) වන ඡේදයේ ආරම්භයේ පළ කර ඇති රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, අංක 380/61 හා 1985 දෙසැම්බර් මස 20 වන දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, විගණන පරීක්ෂක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසි වලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධන වලටද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් විගණන පරීක්ෂක සේවයේ II වනශ්‍රේණියට පත්කරනු ලැබේ.

(ii) මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතය. ඔබ පත්වූ දින සිට ඔබගේ මාසික ඉපැයීම් වලින් සියයට හතක් (7%) වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවන ලෙස ඔබට නියම කෙරේ.

(iii) සාමාර්ථය ලබන අපේක්ෂකයින් පත් කරනු ලබන දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව මෙම සේවයට පත් කරනු ඇත.

(iv) මෙම විභාගය සඳහා තරග කර සාමාර්ථය ලබන අපේක්ෂකයින් ඔවුන්ගේ පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර පහත සඳහන් කරුණු මතද රඳා පවතී :

*(අ)* වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායකවීම;
*(ආ)* පරිවාස කාලය අවසන්වීමට මත්තෙන් කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වීම.

(v) පරිවාස කාලපරිච්ඡේදය අවසානයේ දී තනතුරුවල ස්ථිර කරනු ලැබීමට අපොහොසත් වුවහොත් ඔහුගේ/ඇයගේ සේවය අවසන් කිරීම සිදුවනු ඇත.

04. *වැටුප් පරිමාණය* .- විගණන පරීක්ෂක සේවයේ II වන ශ්‍රේණියට අයත් ඒකාබද්ධ වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (iv) අනුව මාසිකව රුපියල් 16,720-10 x 320 - 11 x 365 - 15 x 450 - රු. 30,685ක් වේ (රු. 17,680ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි)

05. *සෞඛ්‍ය හා විනය* .- අපේක්ෂකයා සෞඛ්‍යය අතින් නිසි පරිදි සුදුසුකම් ඇති බවට ද, විශිෂ්ඨ චරිතයකින් යුක්ත බවට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව සෑහීමකට පත්විය යුතුය. මනා ශරීර ශක්තියකින් ද, හොඳ ඇස් පෙනීමකින් ද යුක්ත විය යුතු අතර, දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරික සුදුසුකම් තිබිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්තව නැති අපේක්ෂකයකු තෝරා ගනු ලැබූ කල්හි ඔහු/ඇය වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ඇත.

06. *සුදුසුකම් :*
සෑම අපේක්ෂකයකුම -

*(අ)* ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය,
*(ආ)* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නොවනඅයදුම්කරුවන්ගේ වයස අවුරුදු 22ට නොඅඩු, වයස අවුරුදු 32ට නොවැඩි විය යුතු අතර, රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 40ට නොවැඩි විය යුතුය,
*(ඇ)* විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය,
*(ඈ)* පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබා තිබිය යුතුය :

(i) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධරයෙකු වීම හෝ සමාන සුදුසුකම් ලබා තිබීම ;

*හෝ*

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ ආවසරික හෝ අන්තර් මාධ්‍ය පරීක්ෂණය සමත්වී තිබීම.
(ii) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ / ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයේ උසස් ජාතික ගණකාධිකරණ/වාණිජ ඩිප්ලෝමාව සමත්වී තිබීම.

*(ඉ)* යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසරයක් නොමැත.

සටහන : මෙම විභාගයේ දී තරග කරන අපේක්ෂකයන් තම තමන්ගේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික සහ සෙසු ලියවිලි විගණකාධිපති විසින් ඉල්ලූ වහාම ඉදිරිපත් කිරීම සඳහා සූදානම්ව තබා ගත යුතුය. විභාගයක ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඉල්ලුම්කළ නොහැකිය.

සටහන.- අපේක්ෂකයෙකු සුදුසුකම් ලබා ඇති සේ සලකනු ලබනුයේ ඔහු/ඇය විසින්,

(i) සාමාර්ථ්‍යය ලැබීම පිණිස අවශ්‍ය වන විභාගය හෝ විභාග 2008.11.07 දින වන විට සෑම ආකාරයකින්ම සාර්ථක ලෙස සම්පූර්ණ කර ඇත්නම්; සහ

(ii) සුදුසුකම් පිළිබඳව නිල සහතිකයක් හෝ එම සහතිකය වෙනුවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පිළිගන්නාවූ නිලලේඛනයක් හෝ සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කර ඇත්නම් පමණි.

07. *විභාග ගාස්තු .-* මෙම විභාගය සඳහා ගාස්තුව රු. 300කි. මේ සඳහා ගාස්තු ආදායම් ශීර්ෂ 4000-20-03-20-13ට බැර කරන ලෙස උපදෙස් සහිතව ඉල්ලුම් පත්‍රය භාරගන්නා අවසන් දිනයට ප්‍රථම ළඟම ඇති ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයට ගෙවිය යුතුය. ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සිය තම ඉල්ලුම්පත්‍රයට ඇලවිය යුතුය. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. (මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සියේ ඡායාස්ථ පිටපතක් ඔබ ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

08. *අයදුම්කිරීමේ ක්‍රමය .-*

*(අ)* අයදුම්පත්‍රය මෙම නිවේදනයට යාකොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කරමින් ඒ4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. 01 සිට 02.5 තෙක් ශීර්ෂ පළමුපිටුවේ ද, 03 සිට 05 (i) තෙක් ශීර්ෂ දෙවන පිටුවෙහි ද, 05 (ii) සිට 09 දක්වා ශීර්ෂ තුන්වන පිටුවෙහි ද, 10 සිට 12 දක්වා ශීර්ෂ හතරවන පිටුවෙහි ද විය යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්පුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

*(ආ)* අයදුම්පත්‍රය අපේක්ෂකයින් විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති භාෂාවෙන් පිරවිය යුතුය. (12 වන ඡේදය බලන්න) ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමරතව ඉංග්‍රීසියෙන් ද, යෙදීම අවශ්‍යවේ.

*(ඇ)* විවෘත තරග විභාගය සඳහා වූ අයදුම්පත්‍ර 2008.11.07 දින හෝ ඊට කළින් හෝ ලැබෙන පිණිස බත්තරමුල්ල, පැලවත්තේ, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත්‍රය බහා ඇති කවරයේ වමත්පස උඩ කෙළවරේ 'විගණන පරීක්ෂක IIතනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය- 2008' යන වගන්තිය පැහැදිලි ලෙස ලිවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පත්‍රයක් භාරගනු නොලැබේ. රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයුදම්කරුවන් ස්වකීය අයදුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

*(ඈ)* සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේ දී ඉල්ලුම්පතක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. තවද, ඔහු/ඇය විභාගයට ඇතුළත් කර ගැනීම ඊට යෝග්‍ය පිළිගැනීමක් බවට පත් නොවේ. එසේ ඇතුළත් කර ගැනීම හුදෙක් තත් කාලීන පසු අවශ්‍යතාවකදී පරීක්ෂා කර බැලීමට යටත් වන්නකි.

*(ඉ)* ඉල්ලුම්පත් ලත් බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කෙරෙනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රය හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද, සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද, ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

*(ඊ)* අත්සන සහතික කිරීමට බලයලත් අයෙකු විසින්, අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතුය. දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින්ගේ අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු ලවා ද, අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන් සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, රු. 20,030ක් හෝ එයට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය නිලධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය

යුතු තත්ත්වයක් දරන පූජ්‍ය කෙනෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු යන මොවුන්ගෙන් කවරකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

09. *විභාගයට ඇතුළුවීම .-*

(අ) ඉල්ලුම්පත් ලැබී ඇති සියලුම පුද්ගලයන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ අධීක්ෂක වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයින් විසින් තම තමන්ට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයකු විසින්ම විභාගය පැවැත්වෙන පළමු දිනයෙහි තම අත්සන සහතික කරවා ගත් ස්වකීය ප්‍රවේශපත්‍රය විභාග අධීක්ෂකට බාරදිය යුතුය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* පළකර ඇත.

(ඇ) අපේක්ෂකයකුට ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු/හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

10. *අපේක්ෂකයාගේ අනන්‍යතාව .-*

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පමණක් පිළිගනු ඇත :

*(අ)* පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත,

*(ආ)* ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

11. *සාවද්‍ය තොරතුරු සැපයීම .-* අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12. *විභාග ක්‍රමය :*

*(අ)* විභාගය සිංහලෙන්, දෙමළෙන් හා ඉංග්‍රීසියෙන් පවත්වනු ලැබේ. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම්කරන නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

*(ආ)* අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම් ලත් විභාගය සඳහා සාමාර්ථ්‍යය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන්ය.

*(ඇ)* අපේක්ෂයකු සුදුසුකම්ලත් විභාගයේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත්ව ඇත්නම්, එම විභාගයේදී ඔහු සමත්වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට යොදාගත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.

*(ඈ)* ප්‍රධාන විෂයය එක් භාෂාවකිනුත්, අතිරේක විෂයයන් තවත් භාෂාවකිනුත් සමත්වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයකු ප්‍රධාන විෂයයන්ට සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයින්ට ඉඩ දෙනු නොලැබේ.

*සටහන :*

(i) ඉහත (ආ) සහ (ඇ) හි සඳහන් 'සුදුසුකම් ලත් විභාග' යන පදයෙන් අදහස් කෙරෙන්නේ 06 වැනි ඡේදයෙහි දක්වා ඇති විභාගවලින් එකක්ය.

(ii) අපේක්ෂකයකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතුය.

13. *පරීක්ෂා කිරීමේ ක්‍රමය.-*

*(අ)* පහත සඳහන් විෂයයන් පහ සඳහා පැවැත්වෙන ලිඛිත පරීක්ෂණයක් මගින් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි :-

| | | | *පැය* | *ලකුණු* |
|---|---|---|---|---|
| 1. | ගණකාධිකරණය | - | 03 | 150 |
| 2. | පිරිවැය ගණකාධිකරණය | - | 02 | 100 |
| 3. | විගණනය | - | 03 | 150 |
| 4. | ව්‍යාපාරික ගණිතය සහ සංඛ්‍යානය | - | 02 | 100 |
| 5. | පරිසරය 1. වැනි කොටස- ආර්ථික විද්‍යාව | | 01 | 50 |
| | 2 වැනි කොටස - සාමාන්‍ය වාණිජ දැනුම | | 01 | 50 |
| | 3 වැනි කොටස -වාණිජ නීතිය | | 01 | 50 |

ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශ 'අ' පරිශිෂ්ඨයේ දැක්වේ.

(ආ) ලිඛිත පරීක්ෂණයේදී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා නියමිත ලකුණු සංඛ්‍යාවෙන් සියයට 40ක අවම ලකුණු ප්‍රමාණයක් ද, මුළු විභාගය සඳහා අවම වශයෙන් සියයට 50ක සාමාන්‍යයක් ද ලබාගන්නා අපේක්ෂකයන් පමණක් සම්මුඛ පරීක්ෂය සඳහා කැඳවනු ලැබීමට යෝග්‍යවන අතර, ලිඛිත පරීක්ෂණයෙන් පසු දැනුම් දෙනු ලබන දිනයකදී සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කිරීමට සහ සේවා වාර්තා පරීක්ෂා කර බැලීම සඳහා වන අතර සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගිනි.

14. *පත් කිරීම පිණිස තෝරා ගැනීමේ ක්‍රමය .-*

ලිඛිත පරීක්ෂණයෙන් ප්‍රශ්න පත්‍ර 05 ට ලබාගත් ලකුණු අනුව ඉහළම ලකුණු ලබාගෙන ඇති අපේක්ෂකයින් තෝරාගනු ලැබේ. අපේක්ෂකයින්

කිහිපදෙනෙකුට එකම ලකුණු ලැබී ඇත්නම් තෝරා ගැනීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

15. ඉහත රෙගුලාසිවලින් ආවරණය නොවන කරුණු ඇතොත් ඒවා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එස්. ස්වර්ණජෝති,
විගණකාධිපති.

2008 ඔක්තෝබර් මස 07 වැනි දින,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

**'අ' පරිශිෂ්ඨය**

**ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය**

(i) ගණකාධිකරණය - පහත සඳහන් විෂයයන් පිළිබඳව පැය 03ක එක් ප්‍රශ්න පත්‍රයකි. (ලකුණු ගණන 150 කි)

* ගණකාධිකරණය න්‍යාය - මූලික සංකල්ප හා මූලධර්ම, වත්කම් ඇගයීමේ ක්‍රම, ද්විත්ව සටහන් න්‍යාය, පිරිවැය, වර්ගීකරණය, ශේෂ පත්‍රවල තොරතුරු වර්ගීකරණය, නිෂ්පාදන, වෙළඳ හා ලාභාලාභ ගිණුම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය

* ගණකාධිකරණ පද්ධති : ගිණුම් ඒකකයක උපයෝගී කරගනු ලබන සම්පත් වල වෙනස්වීම් පාලනය කිරීමේ අවශ්‍යතාව පදනම් කරගත් පාලන සංකල්ප පිළිබඳ අවබෝධය, ප්‍රමිතයන් සමග සැසඳීමේ අවශ්‍යතාවය, ව්‍යාපාරික ගනුදෙනු විශ්ලේෂණය, මිලදී ගැනීම, වෙළඳාම, මුදල් ලැබීම් හා ගෙවීම්, ඉන්වෙන්ට්‍රි පාලනය ආදී මූලික කළමනාකාරිත්ව කාර්ය භාරයන්ට අදාළ පරිපාටි පිළිබඳ නිපුණත්වය, දෛනික පොත්, ලෙජර්, පාලන ගිණුම් ආදී වාර්තා සැලසුම් ආකෘතිය පිළිබඳ නිපුණත්වය.

* ශේෂ පත්‍ර සකස් කිරීම, නිෂ්පාදන, වෙළඳ හා ලාභාලාභ ගිණුම්, සැසඳීම් ප්‍රකාශ, පාලන ගිණුම්, ගණක හා සංඛ්‍යාන අනුපාතයන් ආදිය ඇතුළත් ගණකාධිකරණ ව්‍යවහාරයේ ගැටලු.

(ii) පිරිවැය ගණකාධිකරණය - පහත සඳහන් විෂයයන් පිළිබඳව පැය 02 ක එක් ප්‍රශ්න පත්‍රයකි. (ලකුණු ගණන 100කි)

* පිරිවැයකරණ මූලධර්ම, පිරිවැයකරන වර්ග, මිළදී ගැනීම් හා ගබඩා පරිපාටි, ද්‍රව්‍ය, ද්‍රව්‍ය මිළ කිරීම්, ද්‍රව්‍ය නිකුතු මිළ කිරීම, වේතන, පොදු කාර්ය පිරිවැය, ස්ථාවර හා විචල්‍ය වියදම්, සෘජු හා වක්‍ර වියදම්, අයවැය ලේඛනමය පාලනය, ප්‍රමිත පිරිවැයකරණය, විචලනය, ආන්තික පිරිවැයකරණය, කොන්ත්‍රාත්තු පිරිවැයකරණය, පිරිසැකසුම් පිරිවැයකරණය, වැඩ පිරිවැයකරණය, ප්‍රවාහන පිරිවැයකරණය, නිපැයුම් පිරිවැයකරණය

(iii) *විගණනය* - පහත සඳහන් විෂයයන් පිළිබඳව පැය 03ක එක් ප්‍රශ්න පත්‍රයකි. (ලකුණු 150කි.) විගණන සංකල්ප හා න්‍යාය : විගණනයක අවශ්‍යතාව, ගණන්දීමේ වගකීම විගණනයේ පදනමක් වශයෙන්, විගණන විෂය පථය, විගණන වර්ග, විගණන කාලනිර්ණය, විගනණකරුවන්ගේ සුදුසුකම්, බලතල, විගණනය සඳහා අධිකාරි බලය, පූර්ව විගණනය, අභ්‍යන්තර සෝදිසිය, අභ්‍යන්තර පාලනය, ගැඹුරින් විගණනය, අභ්‍යන්තර විගණනය, ප්‍රමිති සඳහා වන අවශ්‍යතාව, විගණනය සඳහා සාක්ෂි වර්ග, ශිල්පීය ක්‍රම.

* *විගණන පද්ධති සහ පරිපාටි* : ප්‍රධාන ශේෂ පත්‍රය, නිෂ්පාදන, වෙළඳ හා ලාභාලාභ ගිණුම් විෂයයන්, ඉඩම්, ගොඩනැගිලි, ස්ථාවර වත්කම්, ඉන්වෙන්ට්‍රි, මුදල්මය වත්කම්, විකුණුම්, මිලදී ගැනීම්, ලැබීම්, ගෙවීම් ආදිය ආවරණය වන විගණන වැඩ සටහන් පිළිබඳ නිපුණත්වය.

* *විගණන ගැටලු* : නිරීක්ෂණ හැකියාවන් සහ වැරදි හා අසාමාන්‍ය අවස්ථාවන් සොයා බැලීමේ හැකියාව පිරික්සීම සඳහා වන සරළ ගැටළු

* විගණකාධිපතිවරයාගේ කාර්යයන්

(vi) *ව්‍යාපාරික ගණිතය හා සංඛ්‍යානය*- ව්‍යාපාරික ගණිතය හා සංඛ්‍යානය මූලධර්ම පිළිබඳව පැය 02ක ප්‍රශ්න පත්‍රයකි (ලකුණු 100කි)

*ගණිතය :*

* සමීකරණ - ප්‍රස්තාරික විසඳුම් ඇතුලුව ඒකජ හා වර්ගජ සමීකරණ
* ශ්‍රේණි - සමාන්තර හා ගුණෝත්තර
  වට්ටම් ඇතුළුව සුළු පොලිය හා වැල් පොලිය
* සංකරණ සහ සංයෝජන ඇතුළත් මූලික සම්භාවිතා න්‍යාය ගණිතය වගු භාවිතය

*සංඛ්‍යානය.-*

* දත්ත එක්රැස්කිරීම, ඉදිරිපත් කිරීම සහ විවරණය කිරීම
* සංඛ්‍යාන ව්‍යාප්තිය, මධ්‍යයන හා අපකිරණය, සම්මත අපගමනය, සංඛ්‍යාන වක්‍ර විශ්ලේෂණය
* සම්භාවිතාව, ව්‍යාප්තිය හා එහි යෙදවුම්
* නියැදිම සහ වෙසෙයියාව, නියැදි ව්‍යාප්ති සංකල්පය, සම්මත දෝෂය නියැදීම් ක්‍රම, වෙසෙසිතා පරීක්ෂණ
* කාල ශ්‍රේණි- කාල ශ්‍රේණියක සංරචක, උපනති, අනුසෘතු, චාක්‍රික සහ අවධි
* ප්‍රස්තාරික සංදේශනය, සංඛ්‍යාන ප්‍රස්තාර සටහන්

(v) පරිසරය - පහත සඳහන් විෂයයන් පිළිබඳව පැය 03ක එක් ප්‍රශ්න පත්‍රයක් (ලකුණු 150කි)
ආර්ථික විද්‍යා මූලධර්ම, නීතිය සහ සාමාන්‍ය වාණිජ දැනුම

*ආර්ථික විද්‍යාව .-*

* ආර්ථික විද්‍යාව හැදෑරීමේ ස්වභාවය හා වැදගත්කම, මිල පද්ධති, ඉල්ලුම හා සැපයුම, පිරිවැය හා අයභාරය, ලාභ උපරිමය ළඟා කර ගැනීම, නිෂ්පාදන සාධක, තරඟකාරිත්වය හා ඒකාධිකාරය

* ශ්‍රී ලංකා ආර්ථිකයේ ලක්ෂණ, ජාතික ආදායම, දළ ජාතික නිෂ්පාදනය, ගෙවුම් ශේෂය, උද්ධමනය, ආර්ථික පසු බෑස්ම, ස්ථාවර හා චල විනිමය අනුපාත වැනි ආර්ථික ගැටලු, අවමූල්‍යයනය.

* මුදල් හා බැංකුකරණය - මුදල්වල ස්වභාවය, ආකෘතිය හා කර්තව්‍යයන්, මුදල්වල වටිනාකම, සාමාන්‍ය මිළ මට්ටම, ශ්‍රී ලංකා මහ බැංකුවේ, වාණිජ බැංකුවල සහ ණය දෙන හා ඉතිරි කිරීම් ආයතනවල කර්තව්‍යයන්.

*නීතිය :*

* ලංකාවේ පවත්නා නෛතික පද්ධතිවල ඉතිහාසය සැකෙවින් සහ ඒවා අදාළ වන අයුරු, උසාවිවල, කම්කරු උසාවිවල සහ කර්මාන්ත උසාවිවල සංවිධානය සහ කර්තව්‍යයන්, ශ්‍රී ලංකාවේ යුක්තිය පසිඳලීමේ නියුතු විනිශ්චයකාරවරුන්ගේ හා අනෙකුත් වැදගත් නෛතික නිලධාරීන්ගේ කර්තව්‍යයන්

* කොන්ත්‍රාත්තුවේ ස්වභාවය, ස්වාභාවික හා නෛතික පුද්ගලයා, නියෝජ්‍යත්වය බලයෙන් පිට සිද්ධාන්තය.

*සාමාන්‍ය වාණිජ දැනුම.-*

* පද්ධති හා පරිපාටීන් ඇතුළු කාර්යාල සංවිධානය, ලිපි ගොනුගත කිරීම හා සුචිගත කිරීම, කාර්යාල උපකරණ, රැස්වීම් සංවිධානය කිරීම, රැස්වීම් සටහන් හා වාර්තා ලිවීම

* සංවිධාන ව්‍යුහය, සංවිධාන සටහන, කාර්ය මණ්ඩලයේ එක් එක් තරාතිරම් අතර සම්බන්ධතාව, මධ්‍යගත කිරීම, විමධ්‍යගත කිරීම, තනි වෙළෙන්දා, හවුල් ව්‍යාපාර, බද්ධ ව්‍යාපාර, සමාගම්, සමුපකාර, රාජ්‍ය සංස්ථා ඇතුළු ව්‍යාපාර ඒකක

* රක්ෂණ මූලධර්ම සහ වර්ග, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

* මුහුදින්, ගොඩබිමින් හා ගුවනෙන් බඩු ගෙන යාම, ගැල් කුලී, ප්‍රමාද ගාස්තු

* අන්සතු කළහැකි ලියකියවිලි, ගණුදෙනු කිරීමේ හැකියාව යන්නෙහි අර්ථය, චෙක්පත්, විනිමය බිල්පත්, පිටසන්, රේඛණය, ප්‍රතිග්‍රහණය, අගරු කිරීම

* ශ්‍රී ලංකාවේ සමුපකාර මගින් ඉටු කෙරෙන කාර්ය භාරය

* ආයෝජන මූලධර්ම, ශ්‍රී ලංකාවේ ව්‍යාපාර වස්තු වෙළඳපොල

* විකුණුම් කොන්ත්‍රාත්තුව, බඩුවල හිමිකම් පැවරීම, කොන්දේසි සහ ප්‍රතිඥාභාරය, කුලී සින්නක්කරය, වාරික ගෙවීම් මත මිලට ගැනීම් ඇතුළුව හා භාණ්ඩ විකිණීම

* පරිපාටි, ලියකියවිලි, අපනයන ආනයන ක්‍රම, ගෙවීමේ ක්‍රමය සහ කොන්දේසි තීරු බදු සහ නිෂ්පාදන බදු ඇතුළුව ජාත්‍යන්තර වෙළඳාම

* ජාතික සංවර්ධන බැංකුවේ, සංවර්ධන මූල්‍ය සංස්ථාවේ, ලෝක බැංකුවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්යයන් ඇතුළුව සංවර්ධන මූල්‍යය

| විභාග අංකය | |
|---|---|

(කාර්යාලීය ප්‍රයෝජන සඳහා)

**ආදර්ශ අයදුම්පත්‍රය**

**විගණන පරීක්ෂක සේවයේ II වන ශ්‍රේණියට විගණන පරීක්ෂකවරුන්**
***බඳවා ගැනීමේ විවෘත තරග විභාගය- 2008***

Open Competitive Examination for Recruitment of Audit Examiners to Grade II of the Audit Examiner's Service - 2008

(A-4 ප්‍රමාණයේ කඩදාසි 02ක, ශීර්ෂ අංක 01-02 පළමුවන පිටුවට 03-05(i) දෙවන පිටුවටත්, 05 (ii) සිට 09 තෙක් තුන්වන පිටුවටත්, ඉතිරිය හතරවන පිටුවටත් වන ලෙස සකස් කරන්න.)

විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය හා නගර අංකය : නගරය [ ] නගර අංකය [ ]

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය: [ ]

කොළඹ -(COLOMBO) - 1
යාපනය- (JAFFNA) - 2
(නගරය ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ද, නගර අංකය ද කොටුව තුල යොදන්න)

සිංහල - 2 (අදාල අංකය කොටුව තුල ලියන්න)
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

01. නම:

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :___________,
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ : SILVA, S.A.

1.2 සම්පූර්ණ නම:___________,
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.3 සම්පූර්ණ නම:___________,
(සිංහලෙන්/දෙමළෙන්)

02. ලිපිනය:

1.1 ස්ථිර ලිපිනය : (ප්‍රවේශ පත්‍රය ලැබිය යුතු) :___________,
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

2.2 ස්ථිර ලිපිනය:___________,
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 රාජකාරි ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):___________,

2.4 රාජකාරි ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්:___________,
(රාජ්‍ය සේවය/ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙකු ඔහුගේ/ඇයගේ රාජකාරි ලිපිනය ලිවිය යුතුය. ලිපිනයෙහි වෙනසක් සිදුවූයේ නම් එය වහා දැන්විය යුතුය.)

2.5 ජාතික හැඳුනුම්පත් අංකය: | | | | | | | | | | |

03. ජනවර්ගයඃ

සිංහල -1 දෙමළ - 2 ඉන්දියානු දෙමළ - 3 මුස්ලිම් 4
වෙනත් - 5 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. 4.1 ස්ත්‍රී පුරුෂ භාවය
ස්ත්‍රී - 1 පුරුෂ -0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.2 විවාහක- 2 අවිවාහක- 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.3 උපන්දිනය:

වර්ෂය: මාසය: දිනය:

4.4 2008.11.07 දිනට වයස:

අවුරුදු : මාස: දින:

05. (i) මෙම විභාගයට පෙනී සිටීම සඳහා ඔබ ලබා ඇති සුදුසුකම් ඃ

| ලබා ඇති සුදුසුකම | එම සුදුසුකම ලබාගත් දිනය | විෂයයන් | ප්‍රතිඵල නිකුත් කළ දිනය | එම සුදුසුකම ලබාගත් ආයතනය |
|---|---|---|---|---|
| | | | | |

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයේදී සමත්වූ විෂයයන් :

| විෂයයන් | ලැබූ සාමාර්ථය |
|---|---|
| | |

06. අතිරේක අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ඃ

07. තම චරිතය හා හැකියාව ගැන සහතික කළ හැකි අයදුම්කරු නම් කරන තිරකයන් දෙදෙනාගේ නම් හා ලිපිනය ඃ-

(i)
(ii)

08. රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිරත වෙමින් මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් මේවා සම්පූර්ණ කරන්න.

(i) ඔබ අයත්වන සේවාව/දෙපාර්තමේන්තු ශ්‍රේණිය :

(ii) එම සේවාවට/දෙපාර්තමේන්තු ශ්‍රේණියට ස්ථිරව පත් කරනු ලැබූ දිනය :

වර්ෂය මාසය දිනය

09. මුදල් කුවිතාන්සිය නොගැලවෙන ලෙස අයදුම්පත්‍රයට අලවන්න.

(i) අංකය ඃ (ii) මුදල් ගෙවූ ස්ථානය: .
(iii) දිනය ඃ (iv) ගෙවන ලද මුදල (රුපියල්):

(මුදල් කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම පසු විපරමකදී වැදගත් වේ.)

10. *අයදුම්කරුගේ සහතිකයඃ* මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ..................... හා ............................දින දරන මුදල් කුවිතාන්සිය මීට අමුණා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද, තරග විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි.

___________,
අයදුම්කරුගේ අත්සන.

දිනය :___________,

11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම. *(ගැසට් නිවේදනයේ 08(ඊ) ඡේදය බලන්න)*

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ........................................ මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, 2008 ....................... මස ...................වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

___________,
සහතික කරන අයගේ අත්සන හා මුද්‍රාව

දිනය:___________,
සහතික කරන අයගේ සම්පූර්ණ නම:___________,
තනතුර:___________,
ලිපිනය:___________,

12. *ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ*

(දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන විවෘත තරග විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සඳහා)

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ............................................ මහතා/මහත්මිය/මෙනවිය.................... වැනි දින සිට මෙම කාර්යාලයේ

සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම සහ හැසිරීම සතුටුදායක බවත්, ඉහත 01 සිට 08 දක්වා කොටුවල සඳහන් කර ඇති තොරතුරු සියල්ලම, මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පෞද්ගලිකවම පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, 2008 ..............................................මස ..............................................වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

____________,
ආයතන ප්‍රධානියාගේ හෝ ඔහුගේ බලයලත්
නිලධාරියාගේ අත්සන සහ නිල මුද්‍රාව.

දිනය:____________,
සහතික කරන අයගේ සම්පූර්ණ නම:____________,
පදවිය:____________,
ලිපිනය:____________.

10-534

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.